සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - සමාජ ආරක්ෂණ අංශය
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக பாதுகாப்பு அமைச்சு - சமூகபாதுகாப்பு பிரிவு
Ministry of Women, Child Affairs and Social Security - Social Security Division

මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/02/01
ඔබේ අංකය / உமது இல / Your No: ........................
දිනය / திகதி / Date: 2020.04.23

දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,

දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ,

ප්‍රාදේශිය ලේකම්

ප්‍රජාමුල බැංකු හා බැංකු සමිති කළමනාකරු

**<u>දැනට ක්‍රියාත්මක වැඩසටහන්වල රාජකාරි ඉටු කල නිලධාරින්ට දීමනා ලබාදීම</u>**

පීඩාවට පත් සමෘද්ධි ප්‍රතිලාභි පවුල්වලට, අඩු ආදායම්ලාභි පවුල්වලට හා ජීවනෝපාය මාර්ග අහිමි වු පවුල්වලට සහන සැලසීමේ කටයුතු මේ දිනවල දිවයින පුරා වසම් මට්ටමින් ක්‍රියාත්මක වෙමින් පවතී.

02. මාර්තු මාසයේ සිට මෙම කටයුත්තයේදී තම ජීවිත පරදුවට තබා දිවා රෑ නොබලා සක්‍රියව සේවයේ යෙදුනු සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවකයින් සඳහා සමෘද්ධි බැංකු හා බැංකු සමිති උපයාගත් පොලි අරමුදලින් නිවාඩු දින වැටුප්, අතිකාල, දුරකථන හා ඉන්ධන දීමනා ලබාදීමට කටයුතු කර ඇත. එය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| 1. | මාණ්ඩලික නිලධාරින් සඳහා මසකට නිවාඩු දින වැටුප් | - දින 05 |
| 2. | සමෘද්ධි කළමනාකරුවන්, විගණන නිලධාරින් සඳහා මසකට නිවාඩු දින වැටුප් | - දින 05 |
| 3. | සමෘද්ධි සංවර්ධන නිලධාරින් සඳහා මසකට නිවාඩු දින වැටුප් | - දින 05 |
| 4. | ප්‍රවර්ධන/ සංවර්ධන නිලධාරි සඳහා මසකට නිවාඩු දින වැටුප් | - දින 05 |
| 5. | කළමනාකාර සහකාර | - පැය 100 |
| 6. | රියදුරු (දිස්ත්‍රික්ක කාර්යාලයේ) | - පැය 100 |
| 7. | කාර්යාල කාර්ය සහායක | - පැය 100 |

03. මීට අමතරව තම පෞද්ගලික දුරකථනය, යතුරුපැදි, මෝටර් රථ මෙම රාජකාරි කටයුත්ත සඳහා යොදවාගත් නිලධාරින් සඳහා 2020 මාර්තු හා අප්‍රේල් මාස දෙක වෙනුවෙන් මාසික දුරකථන දීමනා රු. 2000/- ක් හා ඉන්ධන දීමනාව සඳහා රු. 1000/- ක් ලබාගැනීමට අවස්ථාව සලසා දී ඇත. මෙම දීමනාව ලබාගැනීමට පෙර අදාල නිලධාරියා තම දුරකථනය හා වාහනය මෙම කාර්ය සඳහා යොදාගත් බවට අංශ ප්‍රධානි හෝ ආයතන ප්‍රධානියාගේ අනුමැතිය ලබාගත යුතුය.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මුල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | wajira | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

04. දැනට දුරකථන දීමනාව හිමි මාණ්ඩලික නිලධාරින්ට එම දුරකථන දීමනාවට වඩා තම බිල්පත් මෙම කාලය තුල ඉක්ම ගොස් ඇත්නම් රු. 2000/- උපරිමයට යටත්ව මෙම දීමනාව ලබාගත හැක. ඉන්ධන දීමනාව ලබාගත නොහැක.

05. මෙම ගෙවීම ප්‍රජාමූල බැංකු කාර්ය මණ්ඩලය සහ ක්ෂේත්‍ර සමෘද්ධි සංවර්ධන නිලධාරින් සඳහා ප්‍රජාමූල බැංකුවෙන් ද බැංකු සමිති කාර්ය මණ්ඩලය සඳහා බැංකු සමිතියෙන් ද ගෙවීම් කල යුතුය.

06. මෙම කාර්ය වෙනුවෙන් රාජකාරියේ යෙදුනු ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ මුලස්ථාන හා දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයේ කාර්ය මණ්ඩලයට හිමි දින වැටුප් හා දීමනා, දැනටමත් ලබා දී ඇති ප්‍රතිපාදන වලින් ලබාගත යුතුය. එය ප්‍රමාණවත් නොවන අවස්ථාවල ප්‍රධාන කාර්යාලයෙන් ඉල්ලීම් කළ යුතුය.

07. 2020 ජනවාරි මස සිට විවිධ තනතුරුවල වැඩ බලන නිලධාරින්ගේ අදාල ගෙවීම් සඳහා එම ලේඛණ ඉතා කඩිනමින් ප්‍රධාන කාර්යාලයේ පාලන අංශය වෙත ඉදිරිපත් කරන ලෙස ද කාරුණිකව දන්වමි.

08. දිස්ත්‍රික්කයේ මුදල් අවශ්‍යතාවය සකස් කර ප්‍රධාන කාර්යාලයේ මුදල් අංශයට යොමු කර තම දිස්ත්‍රික්කයේ මුදල් අවශ්‍යතාවය ලබාගත යුතුය.

09. මෙහිදි මෙම ගෙවීම් කිරිමේදී ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. ඒ වගේම නිලධාරින්ගේ ඉදිරි වැඩසටහන්, කළ වැඩසටහන් හා කාර්යාලීය පැමිණිමේ ලේඛණ ගෙවීම් කිරිමේදී අදාල කරගත යුතුය.

10. තවද සත්‍ය වශයෙන් මෙම කාර්යයේ යෙදුනු නිලධාරින් සඳහා පමණක් ගෙවීම් කිරිමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

01. ගරු අමාත්‍ය පවිත්‍රාදේවි වන්නිආරච්චි මැතිණිය,
    කාන්තා,ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - ලබාදුන්උපදෙස් පරිදි - කා.දැ.ස.
02. ලේකම් , කාන්තා,ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - කා.දැ.ස
03. ලේකම් , සමාජ ආරක්ෂණ රාජය අමාත්‍යාංශය - කා.දැ.ස
04. ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
05. ප්‍රධාන අභ්‍යන්තර විගනක - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
06. අධ්‍යක්ෂ- ක්ෂුද්‍රමූල්‍ය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
07. අධ්‍යක්ෂ (පාලන) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.